ලියන ලද්දේ Museum Department
2016 මැයි 17 වෙනි අඟහරුවාදා, 08:52 - අවසන් යාවත්කාලීන කිරීම 2016 මැයි 26 වෙනි බ්‍රහස්පතින්දා, 10:37



ජාත්‍යන්තර කෞතුකාගාර දින සැමරුම 2016 මැයි මස 18 වන දින මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරයේදී.......................

---

ජාත්‍යන්තර කෞතුකාගාර දින සැමරුම 2016 මැයි මස 18 වන දින ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය කේන්ද්‍ර කර ගනිමින් හම්බන්තොටදී පවත්වනු ලැබේ.

වාර්ෂිකව මැයි මස 18 වන දිනට යෙදී තිබෙන ජාත්‍යන්තර කෞතුකාගාර දිනයේදී ජාත්‍යන්තර කෞතුකාගාර සංවිධානය විසින් ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාකාරකම් රාශියක් සිදු කරනු ලබයි. මේ යටතේ වැඩමුළු, ප්‍රකාශන, පුහුණුවීම්, ද්විත්ව වැඩසටහන් හා කෞතුකාගාර දියුණු කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි.

ඒ අනුව මවෙරත් කෞතුකාගාර හා සංස්කෘතික භූ දර්ශන (Museum and Cultural Landscapes) යන තේමාව යටතේ ශ්‍රී ලාංකයේ කෞතුකාගාර දින සැමරුම පාසැල් සිසුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට සියලූ කටයුතු සූදානම් කර ඇත. එහිදී ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් පාසැල් සිසුන් උදෙසා රෝහණයේ සංස්කෘතික උරුමය හා ස්වාභාවික උරුමය පිළිබඳ හැඳින්වීම යන මැයෙන් දශේන දෙකෙක්ද ඇතුළුව පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීම සහ අධ්‍යයනය කිරීම, කෞතුකාගාරවේදය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම ඇතුළුව ක්‍රියාකාරකම් රාශියක් සංවිධානය කර ඇත. එමෙන්ම මෙහිදී ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් සහභාගී වන පාසැල් පුස්තකාල සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන ඇතුළත් පොත් කට්ටලය බැගින් ලබා දීමටද කටයුතු සංවිධානය කර ඇත.